**පස්සර ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**
---------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1. මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 30 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මැයි 08 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වරයාගේ වාර්තාව 2015 අගෝස්තු 13 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට පස්සර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

(අ) දේපල පිරියත උපකරණ ප්‍රමිතිය අනුව ස්ථාවර වත්කම් සම්බන්ධව ගිණුම් සකස් කර හා හෙළිදරව් කර නොතිබුණි.

(ආ) තොග සම්බන්ධ ගිණුම්කරන ප්‍රමිතිය අනුව තොග සම්බන්ධ ගිණුම් කටයුතු මිල කිරීම් හෙළිදරව් කර නොතිබුණි.

1.3.3 **ගිණුම්කරණ අඩුපාඩු**

----------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ සභාව විසින් සේවකයන් 08 දෙනෙකුගෙන් අයකරන ලද සේවක ඇප තැන්පත් රු.29,232 ක් ගිණුම්ගත කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාලව පිළිවෙලින් අක්කර බදු හා බලපත්‍ර ගාස්තු රු.45,540 ක් හා රු.23,580 ක් ගිණුම්ගත කර නොතිබීම නිසා ආදායම රු.69,120 කින් අඩුවී ඇත.

(ඇ) සමාලෝචිත වර්ෂයේ සහනාධාර ලෙස පුද්ගලයෙකුට ලබාදුන් රු.10,000 ක් වූ වකුගඩු ආධාර මුදල්, ආධාර මුදල්, දායක මුදල් හා සහනාධාර ශීර්ෂය යටතේ ගිණුම්ගත විය යුතු වුවත්, ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ ඉදිකිරීම් කර්මාන්ත සඳහා ගෙවිය යුතු ප්‍රාග්ධන වියදම් ලෙස රු.10,000 ක් විවිධ ණයහිමියන් ලෙස වෙන්කර තිබුණද, එවැනි වියදමක් විගණනයේ දී අනාවරණය නොවීය.

(ඉ) සමාලෝචිත වර්ෂයේ සභාව විසින් ඉදිකරන කර්මාන්තවලට ගෙවිය යුතු නිමි වැඩ වටිනාකම රු.11,536,995 ක් මුල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණ අතර එම වටිනාකම තුල රු.1,414,946 ක් වැඩියෙන් වෙන්කර ගිණුම්වල දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ ඉන්ධන සඳහා වැය කරනලද රු.40,000 ක මුදලක් ප්‍රවාහන අවශ්‍යතා සේවා වලට හර කළ යුතු වුවත්, ගමන් වියදම් ගිණුමට හරකර තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ මුල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති තැන්පත් ගිණුමේ ශේෂයට වඩා රු.502,585 ක අගයක් ලෙජර් ගිණුම් හා ලේඛන අනුව අනාවරණය විය.

(ඌ) සමාලෝචිත වර්ෂයේ අරළුගොල්ල ජල යෝජනා ක්‍රමය නමින් ව්‍යාපෘතියක් සඳහා සභාව රු.256,605 ක් ගෙවිය යුතු නිමිවැඩ වටිනාකම ලෙස ගිණුම්වල දක්වා තිබුණද, එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.

1.3.4 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

---------------------------------

සභාව විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 20,756,450 ක් වූ අතර, ගෙවිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු.17,439,387 ක් විය.

**1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

රුපියල් 21,052,781 ක් වටිනා ගිණුම් විෂයන් 04 ක්, අදාල විගණන සාක්ෂි ඉදිරිපත් නොවීම නිසා විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

**1.3.6 නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම්**

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා විගණනයේ දී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 217 හා 218 | සමාලෝචිත වර්ෂයේ දී සභාව සතු හා සභාව විසින් ප්‍රයෝජනයට ගන්නා සියලුම ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂයකටම වරක් පරීක්ෂා කරවීමට සභාපතිවරයා කටයුතු කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි | |
| (i) මු.රෙ. 371 | 2006 වර්ෂයේ දෙන ලද අත්තිකාරම් රු.113,496 ක් මුදල් රෙගුලාසි ප්‍රකාරව පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) මු.රෙ. 1646 | 2014 වර්ෂයේ භාවිතා කරන ලද වාහන 05 ක් සම්බන්ධව මාසික ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත | 2012 වර්ෂයේ ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයකර ගන්නා ලද රු.13,821 ක් එකතු කළ අගය මත බදු වටිනාකම දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය නොකර තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. |

2. **මූල්‍ය සමාලෝචනය**

**-----------------------**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

**--------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,609,095 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.8,783,025 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ ශුද්ධ අඩුවීම රු.6,173,930 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

**---------------------**

2.2.1 **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

**-------------------------------------**

(අ) ඉකුත් වර්ෂයේ පිළිවෙලින් හිඟ ආදායම් අයකර තිබුනේ වරිපනම් බදු, ජල ගාස්තු, අක්කර බදු, කඩ කාමර කුලී හා ටෙන්ඩර් කඩ කාමර කුලී 53.9%, 62.9%, 28.6%, 34.6% හා 49.3% ක් වශයෙනි. හිඟ ආදායම් අයකර ගැනීමේ ප්‍රගතිය අසතුටුදායක තත්ත්වයක විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ පිළිවෙලින් සතිපොල කඩ කාමර කුලී, අක්කර බදු, ජල ගාස්තු, වරිපනම් බදු වලින් බිල්කළ ආදායම අයකිරීම 19.6%, 38%, 53%, 71.7% ක් වේ. මේ අනුව වර්ෂයේ හිඟ ආදායම් අයකරගැනීමේ ප්‍රගතියක් විගණනයට නිරීක්ෂණය නොවීය.

2.2.2 **වරිපනම් බදු**

**-------------**

(අ) වර්ෂ 05 කට වරක් වරිපනම් බදු සංශෝධනයක් සිදුකර ඒ අනුව වරිපනම් බදු අයකළ යුතු වුවද 2014 වර්ෂය සඳහා 2005 වර්ෂයේ තක්සේරුව පදනම් කරගෙන වරිපනම් බදු අයකරමින් පැවැතුනි.

(ආ) හිඟ හිටි වරිපනම් බදු රු.364,499 ක් දිගින් දිගටම පවතින අතර, 1987 අංක 15 ප්‍රාදේශීය සභා පනතේ 158(1) වගන්තිය ප්‍රකාරව හිඟ මුදල් අයකර ගැනිමට ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

2.2.3 **කඩ කාමර බදුකුලී**

**---------------------**

(i) 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව අවුරුදු පහෙන් පහට බදු කුලී තක්සේරු කළ යුතු වුවත්, එසේ නොකර කඩ කාමර 20 ක් සඳහා 2005 වර්ෂයේ තක්සේරුව පදනම්ව රු.500 බැගින් මාසිකව බදු කුලි අයකරගෙන තිබුණි.

(ii) සතිපොල භූමියේ පිහිටි කඩ කාමර 13 ක් සඳහා මාස 14 සිට මාස 107 දක්වා කාලයක් තුල කුලී හිඟව පැවැති අතර 2014 දෙසැම්බර් 31 දිනට එම හිඟය රු.72,675 ක් විය. එම හිඟ කුලී 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 159(1) විධිවිධාන හා අදාල බදු ගිවිසුම්වල විධිවිධාන ප්‍රකාරව කටයුතු කර අයකර ගැනීමට හෝ කඩ කාමර අයිතිය සභාව වෙත පවරාගෙන නැවත බදු දීමට හෝ කටයුතු කර නොතිබුණි.

2.2.4 **හිඟ ජල ගාස්තු**

----------------

2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ජල ගාස්තු හිඟ මුදල රු. 1,763,925 ක් වූ අතර, රු.1,000 ට වඩා ගාස්තු හිඟ ජල පාරිභෝගික සංඛ්‍යාව 484 ක් විය. රු.1,000 ට වැඩි හිඟ ජල සම්බන්ධතාවයන් විසන්ධි කිරීමට 2014 ඔක්තෝබර් 30 දින සභා අනුමැතියක් ලබාගෙන තිබුනද, 2014 දෙසැම්බර් 31 දින වන විටද එය ක්‍රියාත්මක කර නොතිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

3.1 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

----------------------------------

(අ) 1996 වර්ෂයේ දී අගරු වූ රු.43,212 ක් වටිනා චෙක්පත් 02 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 189 ප්‍රකාරව කටයුතු කර එම වටිනාකම අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) සභාපතිවරයා සහ උප සභාපතිවරයා විසින් පාවිච්චි කරන ලද රු.36,908 ක් වූ SAMSONG ජංගම දුරකථන දෙක 2015 මැයි 15 දිනෙන් ඔවුන්ගේ නිල කාලය අවසන් වුවද ආපසු සභාවට භාරදී නොතිබුණි.

(ඇ) සභාව විසින් බදුදී තිබූ කඩ කාමර 03 ක් සඳහා අදාල බදුකරුවන් විසින් ගෙවීම් පැහැර හැර ඇති විදුලි ගාස්තු රු.56,626 ක් සභා අරමුදලින් ලංකා විදුලිබල මණ්ඩලය වෙත ගෙවා තිබූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විටද එය අදාල පාර්ශවයන්ගෙන් සභාවට අයකර ගෙන නොතිබුණි.

3.2 අවිධිමත් ගනුදෙනු

---------------------

කසල හා අපද්‍රව්‍ය ඉවත් කිරීමේ වැඩසටහන් 03 ක් සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන වලට පටහැනිව ටෙන්ඩර් කැඳවීමෙන් තොරව රු.782,325 ක් ගෙවා බැකෝ යන්ත්‍රයක් මිලදී ගෙන තිබුණි.

3.3 **පරිසර බලපෑම්**

----------------

(අ) සභාව විසින් 1980 අංක 47 දරන පාරිසරික පනතේ හා 1988 අංක 56 සහ 2000 අංක 53 දරන සංශෝධිත පනත්වලින් නියමිත විධිවිධාන ප්‍රකාරව, 2014 දෙසැම්බර් 31 දින වනවිට සභා බල ප්‍රදේශය තුල ක්‍රියාත්මක පරිසර බලපත්‍ර ලබාගත යුතු ස්වරූපයේ ව්‍යාපාර 58 ක් සඳහා පරිසර බලපත්‍ර 10 ක් පමණක් ලබාදී තිබුණි.

(ආ) 1980 අංක 47 දරන පාරිසරික පනතට අනුව කසල ප්‍රතිචක්‍රියකරණය සඳහා සභාවේ අරමුණුවලට අනුව කටයුතු කළ යුතු වුවත්, නිරාවරණ ප්‍රදේශයක කසල ගොඩ ගැසීම හේතුවෙන් අවට ප්‍රදේශයේ පාරිසරික බලපෑම් ඇතිවී ඇත.

4. **පද්ධති හා පාලන**

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ආදායම් පරිපාලනය

(ආ) ගිණුම්කරණය

(ඇ) වාහන පාලනය